**<u>මාතලේ මහාධිකරණයේ දී ය</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

අධිචෝදක

**එරෙහිව**

මහාධිකරණ නඩු අංක 31/2024

අමිත් පටෙල් හෙවත් යෝගී පටෙල්

චූදිත

වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 20 වන දින දී ය.

මාතලේ මහාධිකරණයේ ගරු මහාධිකරණ විනිසුරුතුමා වෙත ඔප්පු වන පිණිස,

**<u>මෝෂන් පත්‍රයයි</u>**

උකත් අංක සඳහන් නඩුව ඔබතුමාගේ ගරු අධිකරණයේ 2025.01.15 දින, වැඩිදුර සාක්ෂි විභාගය සඳහා නියමිත වූ අතර එදින චූදිත වෙනුවෙන් පෙනීසිටි ජනාධිපති නීතිඥ මොහාන් වීරකෝන් මහතා චූදිත වෙනුවෙන් එදින සිට ඉදිරියට ගරු අධිකරණයේ පෙනී සිටිමින් නඩු විභාගය සිදු කරගෙන යාම සඳහා තමා වෙත චූදිතගෙන් උපදෙස් ලැබී ඇති බව සැලකර සිටින ලදී.

වැඩිදුරටත් උගත් ජනාධිපති නීතිඥවරයා සැලකර සිටියේ චූදිත එදින උදෑසන දුරකථනයෙන් ඔහු අමතමින් නඩු විභාගයට අධිකරණයේ පෙනී සිටීම සඳහා පැමිණෙමින් සිටිය දී ඇති වූ හදිසි අසනීප තත්වයක් හේතුවෙන් ඔහු හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වී ඇති බවයි..

කෙසේ නමුත් මෙම නඩුවේ චූදිත ගරු අධිකරණයේ ඇප කොන්දේසි උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවෙන් නීති විරෝධී ආකාරයෙන් පැන ගොස් ඇති බවට පැමිණිල්ලට මේවන විට තොරතුරු ලැබී ඇති අතර ඊට අදාලව චූදිත විසින් අවසන් වරට තම පදිංචි ස්ථානය වශයෙන් ගරු අධිකරණයට දැනුම් දී ඇති ලිපිනයේ පිහිටි හෝටලය වෙත ගොස් පරීක්ෂා කිරීමේ දී චූදිත 2024.12.31 දින දක්වා එහි රැඳී සිට ඇති බවත් 2025.01.06 දින දක්වා කාමර වෙන් කරවාගෙන ඇති නමුත් 2024.12.31න් පසුව එහි පැමිණ නොමැති බවත් අනාවරණය වී ඇත. චූදිගේ ඇපකරුවන් ගෙන් විමසීමේ දී චූදිත 2024.01.29 දින ක්‍රීඩා වැරදි පිළිබඳ විශේෂ පොලිස් විමර්ශන පෙනී සිට අත්සන් කිරීම සඳහා රැගෙන පැමිණි පසුව චූදිත සම්බන්ධයෙන් තොරතුරු නොදන්නා බව දන්වා ඇත.

ඒ අනුව මෙම නඩුවේ චූදිත ඔබතුමාගේ ගරු අධිකරණය මගහරින බව සාධාරණ සැකයක් ජනිත වී ඇති අතර ඒ සම්බන්ධයෙන් කරුණු විමසීම සඳහා එම චූදිතගේ ඇපකරුවන්ට මෙම නඩුව විභාගය සඳහා

කැඳවීමට නියමිත 2025.01.24 වන දින විවෘත අධිකරණයේ පෙනී සිටීම සඳහා නොතිසි නිකුත් කිරීමේ නියෝගයක් සිදු කරන ලෙස පැමිණිල්ල වෙනුවෙන් ගෞරවයෙන් අයැද සිටිමි.

මෙම තත්ත්වය සම්බන්ධයෙන් ක්‍රීඩා වැරදි පිළිබඳ විශේෂ විමර්ශන ඒකකය විසින් සිදු කරන ලද මූලික විමර්ශන පිළිබඳ වාර්තාව ගරු අධිකරණයේ අවධානය පිණිස මේ සමග අමුණා ඉදිරිපත් කරමි.

පැමිණිල්ලේ රජයේ අධිනීතිඥ